මගේ අංකය :- SP-PSC/32/LI/08/02
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය සංකීර්ණය ,
කළුවැල්ල, ගාල්ල.
2026.08. 28

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා / සැලසුම් හා මෙහෙයුම්),
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දකුණු පළාත.

## දකුණු පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී තනතුරෙහි II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

## Limited Competitive Examination for Recruitment to the Post of Probation Officer Grade II of Department of Social Welfare, Probation & Childcare Services in Southern Province – 2026

1.0 දකුණු පළාත් රාජ්‍ය සේවයේ සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ දකුණු පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී බන්ධ 2 සේවා ගණයේ (MN 05) පරිවාස නිලධාරී තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026 දෙසැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.sp.gov.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2026 සැප්තැම්බර් මස 21 වැනි දින වේ.

සටහන 01 :- මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026 අගෝස්තු මස 28 වැනි දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර, 2026 සැප්තැම්බර් මස 21 වැනි දින ප.ව. 6.00 ට අවසන් වේ.

මෙම විභාගය ගාල්ල නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පමණක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

2.0 බඳවා ගැනීමේ ක්‍රමවේදය :-
ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ එක් විෂයයකට ලකුණු 40ට වඩා ලබාගත් විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන් ලබාගත් මුළු ලකුණුවල ප්‍රමුඛතාවය මත අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර, සුදුසුකම් පරීක්ෂා කර පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40% ක පුරප්පාඩු සංඛ්‍යාවට සමාන වන පිරිසක් බඳවා ගනු ලැබේ.

3.0 (අ) සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව 02 කි.

සටහන 02 - බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් 60%ක් විවෘත ධාරාව යටතේ සහ 40% ක් සීමිත ධාරාව යටතේ බඳවා ගැනේ. විවෘත ධාරාව යටතේ බඳවා ගන්නා අයදුම්කරුවන්

60% ක් නොමැති වූ විට එම පුරප්පාඩු ප්‍රමාණය සීමිත අයදුම්කරුවන්ගෙන් ද, සීමිත ධාරාව යටතේ බඳවා ගන්නා අයදුම්කරුවන් 40% ක් නොමැති වූ විට එම පුරප්පාඩු ප්‍රමාණය විවෘත අයදුම්කරුවන්ගෙන් ද, සම්පූර්ණ කරනු ලැබේ.

(අ) පත්වීම ක්‍රියාත්මක වන දිනය හා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධ තීරණය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අංක 262 හා 2016.04.01 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද දකුණු පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී බණ්ඩ 2 සේවා ගණයේ (MN 05) පරිවාස නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි පනවා ඇති නියම හා කොන්දේසිවලට ද එම පටිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි / දකුණු පළාත් මුදල් රීති විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් දකුණු පළාත් සමාජ සුබසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී බණ්ඩ 2 සේවා ගණයේ (MN 05) පරිවාස නිලධාරී II ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

(ඇ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ. තවද, භාෂා ප්‍රවීණතාවය සම්බන්ධයෙන් බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධාන අදාළ වේ.

4.0 වැටුප :-

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 05-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු. 58,660-10×1,190-11×1,360-15×1,670-110,570/-ක් වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

5.0 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.

6.0 බඳවාගැනීමේ සුදුසුකම් :-

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු ම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

6.1 අධ්‍යාපන සුදුසුකම් :-

සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, දර්ශනය, අපරාධ විද්‍යාව, නීතිය හා සමාජ වැඩ යන විෂයයන්ගෙන් එකක් හෝ කිහිපයක් ඇතුළත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

6.2 පළපුරුද්ද :-

දකුණු පළාත් රාජ්‍ය සේවයේ වසර පහකට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාල සීමාවට අදාළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති සේවයේ ස්ථිර කරන ලද නිලධරයෙක් විය යුතුය.

6.3 කායික සුදුසුකම් :-

1. අයදුම්කරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා ශාරීරික, මානසික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

2. දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

6.4 වෙනත් සුදුසුකම් :-

I. සෑම අයදුම්කරුවෙක්ම ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

II. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනකට නොඅඩු කාලයක් දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය.
( පදිංචිය ඡන්ද හිමි නාම ලේඛනයක සහතික කළ උද්ධෘතයන් සමින් සනාථ කළ හැකි විය යුතුය.)

III. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඩුවමක් ලබා නොතිබිය යුතු ය.

IV. බඳවා ගන්නා සියලුම නිලධරයන් තම සේවා කාලය වසර 10 සම්පූර්ණ වීමට ප්‍රථම දකුණු පළාත තුළ, තමාගේ ස්ථිර පදිංචිය දිස්ත්‍රික්කයෙන් පිටත දිස්ත්‍රික්කයක වසර 03ක අනිවාර්ය සේවා කාලයක් සේවය කල යුතුවේ.

6.5 වයස :-
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නො අඩු විය යුතු අතර, උපරිම වයස් සීමාව අදාළ නොවේ.

7.0 විභාග පටිපාටිය :-
මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත් වේ. අයදුම්කරුවෙකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| විෂයය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනීම හා සාමාන්‍ය දැනීම | පැය 1 ½ | 100 | 40 |
| අභියෝග්‍යතාව | පැය 1 ½ | 100 | 40 |

විභාගය සමත්වීම සඳහා විෂයයන් දෙකම සමත් විය යුතු ය.

7.1 විභාගය සඳහා වන විෂය නිර්දේශය පහත පරිදි වේ.

| විෂයය | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ දැනුම හා සාමාන්‍ය දැනීම | ජාතික හා ජාත්‍යන්තර, සමාජ ආර්ථික, දේශපාලන හා කාලීන තොරතුරු හා විෂයය ක්ෂේත්‍රයටඅදාළව ළමා අපචාර, හිංසනය හා ළමුන් සම්බන්ධ ජාත්‍යන්තර නීති රීති පිළිබඳ ප්‍රශ්න ද ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. |
| අභියෝග්‍යතාව | භාෂා හැකියාව, ගණිතමය කුසලතාව, තර්ක ශක්තිය මැන බැලෙන කෙටි හා බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. |

8.0 විභාග ප්‍රතිඵල :-
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk මගින් එක් එක් අයදුම්කරුට පෞද්ගලිකව බාගත කර ගැනීමට හැකිවන පරිදි විභාග ප්‍රතිඵල නිකුත් කරනු ලබන

අතර, විභාගය සමත් අයදුම්කරුවන්ගේ කුසලතා අනුපිළිවෙල අනුව සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනයේ සහතික කරන ලද පිටපතක් දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් වෙත නිකුත් කරනු ලැබේ.

**9.0 විභාග ගාස්තු :-**

විභාග ගාස්තුව රු. 1,000/- කි. මාර්ගගත ව (Online) විභාග ගාස්තු ගෙවිය යුතු වේ. සියලුම ගෙවීම් සිදුකළ යුත්තේ **VISA හෝ MASTER** කාඩ්පත් මඟින් පමණක් වන අතර, ඒ හැර වෙනත් ක්‍රමයක් මඟින් සිදු කරනු ලබන ගෙවීම් කිසිදු ආකාරයකින් පිළිගනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තුව අඩුවෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

කිසිදු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බව ද සැළකිය යුතු ය.

සටහන 03 - අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතු ය.

**10.0 අයදුම්කළ යුතු පිළිවෙල :-**

සියලුම අයදුම්කරුවන් www.psc.sp.gov.lk යන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට පිවිස විභාගය නිවැරදි ව තෝරා, අදාළ තොරතුරු ඇතුළත් කර විභාග ගාස්තු ගෙවීමෙන් පසු ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සඳහා යොමු කළ යුතු ය. ආයතන ප්‍රධානියා විසින් නම් කරන ලද සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරියා අදාළ තොරතුරු පරීක්ෂාකර මාර්ගගතව නිර්දේශය ලබා දීමෙන් පසු අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කළ යුතු ව ඇත. මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ කාල සීමාව **2026 සැප්තැම්බර් මස 21 වන දින ප.ව. 06.00** න් අවසන් වේ. (මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිත කිරීම වඩාත් සුදුසු වේ.)

10.1 අයදුම්කරු විසින් ම මෙම විභාගය සඳහා තම අයදුම් පත්‍රය මාර්ගගතව සම්පූර්ණ කළ යුතු අතර, කිසිදු නිලධාරියෙකු වෙනත් නිලධාරියෙකුගේ අයදුම්පතක් එම නිලධාරියාගේ අනුදැනුමකින් තොරව සම්පූර්ණ නොකළ යුතු ය.

10.2 අයදුම්කරුවන් විසින් ඇතුළත් කරනු ලබන කිසිදු තොරතුරක් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එබැවින්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කිරීමට පෙර එම තොරතුරු හොඳින් පරීක්ෂා කිරීම වැදගත් වනු ඇත.

10.3 වෙනත් ක්‍රම මඟින් ඉදිරිපත් කරන අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. මාර්ගගතව මෙම විභාගය සඳහා අයදුම් කිරීමේදී වැරදි විභාගයක් තේරීම වැනි අතපසුවීම්වලින් සිදුවන පාඩුව ඔබ විසින් විඳදරා ගත යුතු වේ.

10.4 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මාර්ගගතව යොමු කරන (Submit) ලද අයදුම්පත බාගත (Download) කර එහි දෘඩ පිටපත (Hard Copy) අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුව තබන්නු වන ආයතනයේ ප්‍රධානියාට භාර දිය යුතුය.

**11.0 ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :-**

විභාගය සඳහා අයදුම් කිරීමේ කාලය අවසන් වීමෙන් පසු දින 02ක කාලයක් තුළ එනම්, **2026 සැප්තැම්බර් මස 23 වැනි දින ප.ව. 6.00** අයදුම්පත් මාර්ගගතව නිර්දේශ කිරීමේ අවස්ථාව පවතී. ඒ

සඳහා අදාළ ආයතනය විසින් නම් කළ මාණ්ඩලික නිලධාරියා විසින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ඇති විභාග අයදුම්පත් නිර්දේශ කිරීමේ කවුළුවට පිවිස (Main menu > Exams > Coordinator Login) අදාළ විභාගය තෝරා තම ආයතනය යටතේ අයදුම්කර ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පරීක්ෂාකර බලා නිර්දේශ කිරීමේ හැකියාව පවතී.

11.1 අයදුම්කරුවන් විසින් සපයා ඇති සියලු තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව තහවුරු කර ගැනීමෙන් අනතුරු ව අයදුම්පත් නිර්දේශ කළ යුතු අතර, යම් හෙයකින් සාවද්‍ය තොරතුරු ඇතුළත් කර තිබියදී අයදුම්පත් නිර්දේශ කර ඇත්නම් ඒ පිළිබඳ වගකීම අදාළ මාණ්ඩලික නිලධාරියා විසින් දැරිය යුතු වේ. අයදුම්පත් නිර්දේශ කිරීමෙන් පසු දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වන අතර, නිර්දේශ නොකරන අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු ලෙසකිනුදු නැවත සලකා බැලීමක් සිදු නොකෙරේ.

11.2 නිර්දේශ කිරීමේ කාලසීමාව අවසන් වූ පසු ස්වයංක්‍රියව එම කවුළුව ක්‍රියා විරහිත වන අතර, නිර්දේශ නොකරන ලද අයදුම්පත් සියල්ල දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) වීමකින් තොරව ප්‍රතික්ෂේප වනු ඇත.

11.3 සියලු අයදුම්පත් නිර්දේශ කිරීමෙන් පසු, එම නිර්දේශිත අයදුම්පත් නාම ලේඛනය එම ස්ථානයෙන් ම බාගත කර මුද්‍රණය කර ගත හැකි අතර, අනිවාර්යයෙන් ම එම නිර්දේශිත අයදුම්පත් නාම ලේඛනයේ දෘඪ පිටපතක් මෙම කොමිෂන් සභාව වෙත තැපැල් මඟින් එවීමට කටයුතු කළ යුතු ය.

11.4 අවශ්‍ය වුවහොත් අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා අයදුම්කරු විසින් ලබා දෙන අයදුම්පතෙහි දෘඪ පිටපත නිර්දේශ කර සුරක්ෂිතව තබා ගත යුතු අතර, අයදුම්පතේ දෘඪ පිටපත් මෙම කොමිෂන් සභාව වෙත යොමු නොකළ යුතු ය.

12.0 **ප්‍රවේශ පත්‍ර :-**

මාර්ගගතව අයදුම්පත් කැඳවන බැවින්, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් තොරව නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත් මාර්ගගත ව ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට මෙම සීමිත තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk ඔස්සේ මාර්ගගත ව ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව ඔබ ආයතනයේ සම්බන්ධීකරණ මාණ්ඩලික නිලධාරියා වෙත කෙටි පණිවිඩයක් මඟින් දැනුම් දෙනු ලබන අතර, වෙබ් අඩවියේ ඇති විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ කවුළුවට පිවිස තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගත හැකි ය.

ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් අදාළ තීරුවෙහි සංශෝධනය විය යුතු ආකාරය නිවැරදිව සඳහන් කර අයදුම්කරුගේ අත්සන යෙදිය යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධනය සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය. බාගත කර ගන්නා ලද විභාග ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් මුද්‍රණය කර, ආයතනයේ ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු මඟින් අත්සන සහතික කරවා විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

## 13.0 විභාගය ශාලාවට ඇතුළත් කර ගැනීම :-

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී ම විභාගයට පෙනී සිටිය යුතු ය.

## 14.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-

ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) ජාතික හැඳුනුම්පත
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii.) වලංගු රියදුරු බලපත්‍රය

විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව තහවුරු කරගත හැකිවන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය. අනන්‍යතාවය තහවුරු නොකරන අයදුම්කරුවන් විභාග ශාලාව තුළට ඇතුළු කරගනු නොලැබේ.

## 15.0 තෝරා ගැනීමේ ක්‍රමය :-

මෙම තනතුර සඳහා විභාගයෙන් දක්වන ලද කුසලතාවය අනුව අයදුම්කරුවන් අතුරින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර, පසුව සුදුසුසන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය මඟින් ශාරීරික යෝග්‍යතාව හා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කරනු ලබන අතර, ලකුණු ලබාදීමක් සිදු නොකරයි.

## 16.0 සාවද්‍ය තොරතුරු සැපයීම :-

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. තව ද, කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

i. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට මෙම කොමිෂන් සභාවට බලය ඇත.

ii. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඇයට පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

17.0 විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඇයට සිදුවනු ඇත.

18.0 විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට ආනුෂංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

සී.පී. රාජකරුණා
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
දකුණු පළාත

2026 අගෝස්තු මස 28 දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

(සැළකිය යුතුයි - ඔබ ආයතනයට අනුබද්ධ ශාඛා කාර්යාල හෝ උප කාර්යාලවල සේවයේ නියුතු මෙම සීමිත තරග විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් ලබන නිලධාරීන් සිටී නම් කරුණාකර ඔවුන් දැනුම්වත් කිරීමට කටයුතු කරන්න.)